tamilguru.lk

# උතුරු මැද පළාතේ පළාත් සහා පාසල්වල පවතින සිංහල ,දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීම -2023 (II අදියර)

උතුරු මැද පළාතේ පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට පළාත් පාදකව බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් සපුරා ඇති උතුරු මැද පළාතේ ස්ථිර පදිංචි උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2023.11.24 වේ.

**01.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය සඳහා පළාත් පදනමින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තරඟ විභාගයෙන් හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලබාගන්නා මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල පරිදි පවතින එක් එක් විෂයේ පුරප්පාඩු සංඛ්‍යාවට අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් බඳවා ගැනීම සිදුකෙරේ. පවතින ප්‍රතිපාදන ප්‍රමාණය හා සේවා අවශ්‍යතාව මත පදනම්ව 2023.06.30 දින දක්වා පැවති පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සිදුකෙරේ. (පුරප්පාඩු ලේඛනය උපලේඛන 01 හි දැක්වේ)

**02.** **වැටුප් පරිමාණය:**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016(iv)හි GE-01-2016A කාණ්ඩය (මාසික 31,490-6×445-7×525-2×600-39,035/-ක්) වේ. උපාධිධාරීන් මෙම වැටුප් පරිමාණයේ 14 වන පියවර වන රුපියල්. 37,835/-වැටුපෙහි පිහිටවනු ලැබේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාද හිමිවේ.

**03.** **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්:**

3.1 අධ්‍යාපන සුදුසුකම්:

I. ඉගැන්වීම් කාර්යයන් සඳහා පිළිගත් සුවිශේෂි කරන ලද ක්ෂේත්‍රවලට අයත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මඟින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මඟින් හෝ ප්‍රදානය කරනු ලැබූ, උපලේඛන 02 හි සඳහන් කර ඇති විෂයයන්ට අදාළ උපාධියක් ලබා තිබීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරක නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව සහ ගණිතය යන විෂයයන් සහිතව විෂ යන් 06 කින් සමත්ව සම්මාන 03 ක් ලබා තිබීම හා අ.පො.ස උසස් පෙළ විභාගයේදී විෂයන් 03 එකවර සමත්ව තිබීම.

ඉතා වැදගත්:- ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කිරීමේදී පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතුය.

- ස්වකීය උපාධිය අනුව ඉල්ලුම් කළ හැකි විෂ යන් පිළිබඳව අයදුම්කරුවන් සැලකිලිමත් විය යුතුය.
- උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂය/විෂ යන් අනුව පමණක් අදාළ ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ හැකිය.
- ඉල්ලුම් කළ විෂය/වි යන් කිසිදු හේතුවක් මත හෝ පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

3.2 කායික සහ මානසික යෝග්‍යතාව:

සෑම අපේක්ෂකයෙකුම ගුරුවරයෙකු වශයෙන් රාජකාරි ඉටු කිරීමට සරිලන මානසික සහ ශාරීරික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

3.3 වයස් සීමාව:

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

3.4 වෙනත් සුදුසුකම්:

I. අයදුම්කරු /අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.
III. උතුරු මැද පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි විය යුතුය.
IV. අයදුම්කරු හෝ කලත්‍රයා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වසර 03 කට නොඅඩු ාලයක් උතුරු මැද පළාතේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය. (ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකයක් මගින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී පදිංචි සනාථ කළ යුතුය.)

## 04. සේවා කොන්දේසි:-

4.1 පත්වීම් ලබන පාසලේ වැඩ භාරගත් දින සිට අවුරුදු 05 අවම සේවා කාලයක් අනිවාර්යෙන්ම සේවය කළ යුතුය. අවුරුදු 05 ක සේවා කාලයකින් පසුව පමණක් ස්ථාන මාරු සඳහා සුදුසුකම් ලබයි.

4.2 රාජ්‍ය/පළාත් සභා රාජ්‍ය සේවා පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලටද, උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසි වලටද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධන වලටද යටත්ව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට පත්කරනු ලැබේ.

4.3 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

4.4 විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් ඉදිරියේදී රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට අනුකූල විය යුතුය.

4.5 මෙම තනතුරට පත්වන අපේක කයින් වසර 03 ක පරිවාස කාලය ටත් වේ.

4.6 ගුරු සේවයේ උසස්වීම් උතුරු මැද පළාත් ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන ටතේ සිදුකරනු ඇත.

4.7 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා 2020.10.16 දිනැතිව සිදුකළ සංශෝධන මගින් නිශ්චිතව දක්වා ඇති පරිදි දෙවන භාෂාවේ ප්‍රවීණතාවය ලබාගත යුතුය.

## 05. බඳවා ගැනීම

5.1 බඳවා ගැනීමේ ක්‍රමය :

I. 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන උතුරු මැද පළාත් ගුරු සේවා ව්‍යවස්ථාවේ 7.2.4 වගන්ති අනුව බඳවා ගැනීම සිදුකෙරේ.
II. තෝරා ගැනීම සඳහා ලිඛිත විභාගයක් පවත්වනු ලබන අතර, පළාත තුළ එක් එක් විෂයන් සඳහා පවතින පුරප්පාඩු හා සසඳන විට ලිඛිත විභාගයේදී ලබාගන්නා ඉහළම ලකුණු අනුපිළිවෙල අනුව අයදුම්කරුවන් තුන් ගුණයක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
III. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා එදිනම ප්‍රායෝගි පරීක්ෂණය පවත්වනු ලැබේ.
IV. ලිඛිත විභාගයෙන් හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් වැඩිම ලකුණු ලැබූ සහ මෙහි 03 වගන්තියෙහි සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

5.2 ලිඛිත තරඟ විභාගය : ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| විෂය | කාලය | උපරිම ලකුණු | සුදුසුකම් ලැබීම සඳහා ලබාගත යුතු අවම ලකුණු |
|---|---|---|---|
| 1. අභියෝග්‍යතා පරීක්ෂණ | පැය 01 | 100 | 40 |
| 2. සාමාන්‍ය දැනුම | පැය 01 | 100 | 40 |

විෂ නිර්දේශය :

විෂ අංක 01 - අභියෝග්‍යතා පරීක්ෂණය

- මෙම ප්‍රශ්න පත්‍රය සැලසුම් කර ඇත්තේ අපේක්ෂකයාගේ ගුරු වෘත්තියට හා දැනුමට අදාළ කුසලතා හා තාර්කික බුද්ධිය මැන බැලීම සඳහාය. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු ආකාරයේ ප්‍රශ්න 50 කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ල සඳහා පිළිතුරු ලබාදිය යුතුය.

විෂ අංක 02 - සාමාන්‍ය දැනුම

- අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කරන බහුවරණ හා කෙටි පිළිතුරු ආකාරයේ ප්‍රශ්න වලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ.
- සිදුවී ඇති/සිදුවෙමින් පවතින අධ්‍යාපනික සංවර්ධනයෙහි ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම, අධ්‍යාපන නවීකරණය පිළිබඳ දේශීය හා සාමාන්‍ය දැනුම අන්තර්ගත වේ. ප්‍රශ්න සියල්ල සඳහා පිළිතුරු ලබාදිය යුතුය.

5.3 විභාග පටිපාටිය

- මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ. **ඉංග්‍රීසි මාධ්‍ය පුරප්පාඩු සඳහා අයදුම් කරන අපේක්ෂකයන් තමා විභාගයට මුහුණ දෙන භාෂාව අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ සඳහන් කල යුතුය.**
- සෑම අයදුම්කරුවෙකුම විභාගයේ සියලු ප්‍රශ්න පත්‍ර සඳහා එක් භාෂාවකින් පමණක් මුහුණ දිය යුතුය.
- කිසිදු අයදුම්කරුවෙකුට ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රයේ සඳහන් භාෂා මාධ්‍ය පසුව කිසිදු හේතුවක් මත වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.
- සෑම අයදුම්කරුවෙකුම ප්‍රශ්න පත්‍ර දෙකටම(02) පෙනී සිටිය යුතුය.
- බඳවා ගන්නා ප්‍රමාණය පත්වීම් බලධාරියා විසින් තීරණ රනු ලැබේ.

5.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

❖ සේවා ව්‍යවස්ථාවට අනුකූලව ගැසට් පත්‍රයේ හෝ පුවත්පත් දැන්වීමක හෝ වෙබ් අඩවියේ පළකරන ලද නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා තිබේද යන්න හා ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම, උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සිදු කරනු ලැබේ.

5.5 ප්‍රායෝගික පරීක්ෂණය

| අනු අංක | ප්‍රායෝගික පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිෂ්ය වීම | 05 |
| 02 | පෞරුෂය හා හඩ පාලනය | 05 |
| 03 | සන්නිවේදනයේ පැහැදිළි බව | 05 |
| 04 | කාල කළමනාකරණය | 05 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය | 05 |
| **මුළු ලකුණු ප්‍රමාණය** | | **25** |

5.6 ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමය

I. ප්‍රායෝගි පරීක්ෂණය සඳහා මිනිත්තු පහක (05) නොඉක්මවන කාලයක් ලබාදෙනු ඇත.

II. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව විසිපහක් (25) කි.

III. ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් නිර්ණා යක් සඳහා අවම වශයෙන් ලකුණු 02 බැගින් ලබා ගත යුතුය.

IV. උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ප්‍රායෝගික පරීක්ෂණය ඇගයීමට ලක් කෙරේ.

5.7 නිර්ණායකවල අරමුණු

I. අරමුණ හා ප්‍රවිෂ්ඨ වීම
පාඩමේ අරමුණු සාර්ථකව පැහැදිලි කිරීමට ඇති හැකියාව සහ ප්‍රවේශ වීමට ඇති හැකියාව ඇගයීම.

II. පෞරුෂය හා හඬ පාලන
අයදුම්කරුට ගුරුවරයකුට ගැලපෙන හොඳ පෞරුෂයක් සහ කටහඬ පාලනය කිරීමේ හැකියාව තිබේද යන්න ඇගයීම.

III. සන්නිවේදනයේ පැහැදිළි බව
ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිෙ අදාළ ගැටලු ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම.

IV. ාල කළමනාකරණ
නියමිත කාල සීමාව තුල ඉලක් රා ලඟා වීමේ හැකියාව ඇගයීම.

V. ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිත
ඉලක්ක කරා ලඟා වීමට ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම හොඳින් භාවිත කිරීමේ හැකියාව ඇගයීම

06. විභාග ගාස්තු

6.1 විභාග ගාස්තු රු.720 කි. මෙම මුදල අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ එදිනට පෙර උතුරු මැද පළාතේ පිහිටි ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට උතුරු මැද පළාත් සභාවේ අය අංක 2003.02.13ට බැර වන ලෙස ගෙවිය යුතුය. ඒ සඳහා නිකුත් කරන එන්සී 100 රිසිට්පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. කුමන හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, ගාස්තුව වෙනත් විභාගයකට මාරු කිරීමට ද ඉඩ දෙනු නොලැබේ. එසේම මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ. විභාග ගාස්තු ගෙවනු නොලබන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. (රිසිට්පතේ ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා අයදුම්කරු ළඟ තබා ගැනීම සුදුසුය) විභාග ගාස්තු ගෙවීම සඳහා ඉහත නියම කර ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හැර පිට පළාත් කාර්යාල හෝ බැංකු හෝ තැපැල් කාර්යාල වලට ගෙවන ලද හෝ නියමිත දිනට පසුව ගෙවන ලද රිසිට්පත් සහිත අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6.2 විභාග මධ්‍යස්ථාන - මෙම විභාගය පහත දැක්වෙන නගරවල පවත්වනු ලැබේ.

| නගරය | නගර අංකය |
|---|---|
| අනුරාධපුර | 01 |
| පොලොන්නරුව | 02 |

07. අයදුම් කිරිමේ ක්‍රම

7.1 අයදුම්පත්‍ර මෙම නිවේදනය අමුණා ඇති ආදර්ශ ආකෘතිය අනුව අපේක්ෂකයා විසින් කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් A4 ප්‍රමාණයේ කඩදාසිය සකස් කර තම අත්අකුරින්ම සම්පූර්ණ කළ යුතුය. 1 සිට 4.3 තෙක් ශීර්ෂ පළමු පිටුවේ ද 4.4 සිට 7 තෙක් ශීර්ෂ දෙවන පිටුවේද, ඉතිරි ශීර් තෙවන පිටුවේද වන පරිදි අයදුම් පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය.

7.2 අනුකූලව සකස් නොකළ, අසම්පූර්ණ, නියමිත පරිදි විභාග ගාස්තු නොගෙවූ සහ නියමිත දිනය පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එම අයදුම්කරුවන්ට විභාගය පෙනී සිටීම සඳහා ඉඩ දෙනු නොලැබේ. ඒ සම්බන්ධයෙන් පූර්ව දැනුම් දීමක් සිදු නොකෙරේ.

7.3 සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

7.4 අයදුම් කරනු ලබන විෂය/ විෂයයන් කිසිසේත් වෙනස් කරනු නොලබන අතර එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. අයදුම්කරු එක් විෂයකට වඩා වැඩි සංඛ්‍යාවක් සඳහා ඉල්ලුම් කරන්නේ නම් එය ප්‍රමුඛතාගත කර අයදුම්පත්‍රයේ අදාළ ස්ථානයේ සඳහන් කල යුතුය.

7.5 රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් ස්වකීය අයදුම්පත්‍රය අනිවාර්යයෙන්ම තම ආයතන ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු වන අතර, මෙම පත්වීම සඳහා සුදුස්සෙකු වශයෙන් තේරී පත්වුවහොත් එම ආයතනයෙන් නිදහස් කිරීමට එකඟ වන බවට සහතික කරවා ගත යුතුය.

7.6 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :
අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලය ලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ මාණ්ඩලික තනතුරක් දරණ නිලධාරියෙකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරණ මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

7.7 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2023.11.24 දින හෝ ඊට පෙර ලැබෙන සේ **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු මැද පළාත, අනුරාධපුර."** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම - 2023 (II අදියර) " ලෙස හා ඉල්ලුම් කරන විෂය/විෂයයන් අනිවාර්යයනේම සඳහන් කළ යුතුය.**

7.8 **තැපැල් මඟින් ඉදිරිපත් කිරීමේදී අයදුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම පිළිබඳව වූ කිසිදු පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.**

7.9 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් ප්‍රසිද්ධ කරනු ලබන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

08. **අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය:-**
අපේක්ෂකයින් තමා පෙනී සිටින විභාගයේදී, සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පහත ලේඛන වලින් තම අනන්‍යතාවය තහවුරු කළ යුතුය.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

හෝ

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය/වලංගු රියදුරු බලපත්‍රය

09. ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීමේ දී සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. එම තොරතුරු කිසිදු අයුරකින් සංශෝධනයට ඉඩදෙනු නොලැබේ. මෙම බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන්

සුදුසුකම් නියමිත දිනට සම්පූර්ණ කර නොමැති වීම අනුව යම් අයදුම්කරුවකු සම්මුඛ පරීක්ෂණයට සහ ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීමට නුසුදුසු බව අනාවරණය වුවහොත් එම පරීක්ෂණ පැවැත්වීමට පෙර හෝ පැවැත්වෙන අතරතුර හෝ ඉන්පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවන් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමට හැකිවේ.

10. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්හට පදිංචිය, වයස හා උපාධිය වලංගු දිනය යන මූලික සුදුසුකම් හැර අනෙකුත් සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව ලිඛිත විභාගය සඳහා පෙනී සිටීමට අවස්ථාව ලබා දෙනු ලබන අතර මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සම්මුඛ පරීක්ෂණයේ දී සිදු කරනු ලැබේ.

11. උක්ත 10 ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා පමණක් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ලිඛිත විභාගය, සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගි පරීක්ෂණය සඳහා කැඳවීම් ලිපි නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත කැඳවීම් ලිපි නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යාලීය වෙබ් අඩවියේ (**psc.nc.gov.lk**) නිවේදනයක් පළකරනු ලැබේ. විභාග ප්‍රවේශපත්‍රය/ කැඳවීම් ලිපිය ලිඛිත විභාගය/ සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය පැවැත්වෙන දිනට දින 3කට පෙර නොලැබිණි නම් ඒ බව වහාම **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු මැද පළාත, අනුරාධපුර."** යන ලිපිනයට දැන්විය යුතුයි. එසේ දැනුම් දීමේදී පහත විස්තර ඉදිරිපත් කළ යුතුය.

   I. අයදුම්කරුගේ සම්පූර්ණ නම:
   II. පෞද්ගලික ලිපිනය/ සේවා ස්ථානයේ ලිපිනය:
   III. ජාතික හැඳුනුම්පත් අං :
   IV. දුරකථන අං :

12. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ මෙම නිවේදනයෙන් ආවරණය නොවන හෝ මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති වෙනත් කිසියම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

13. මෙම විභාගය, සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය පැවැත්වීම, කල්දැමීම, අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම/ නොගැනීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණයෙන්ම හෝ කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.
උතුරු මැද පළාත.
2023.10.27

පුරප්පාඩු ලේඛනය - (උපලේඛන 01)

| විෂය සංකේත අංකය | විෂය | පවතින පුරප්පාඩු සංඛ්‍යාව (භාෂා මාධ්‍ය අනුව) | | | |
|---|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | ඉංග්‍රීසි මාධ්‍ය | එකතුව |
| 1 | ප්‍රාථමික | 415 | 47 | - | 462 |
| 2 | ඉංග්‍රීසි | 133 | 26 | - | 159 |
| 3 | ගණිතය | 77 | 15 | - | 92 |
| 4 | විද්‍යාව | 95 | 6 | - | 101 |
| 5 | භූගෝල විද්‍යාව | 70 | 10 | 7 | 87 |
| 6 | පෙරදිග සංගීතය | 44 | - | - | 44 |
| 7 | චිත්‍ර | 61 | 11 | - | 72 |
| 8 | ඉතිහාසය | 49 | 5 | - | 54 |
| 9 | පුරවැසි අධ්‍යාපනය | 80 | 12 | 7 | 99 |
| 10 | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | 40 | 10 | - | 50 |
| 11 | දෙවන බස දෙමළ | 41 | - | - | 41 |
| 12 | ව්‍යවසායකත්ව අධ්‍යයනය | 8 | - | - | 8 |
| 13 | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | 18 | 8 | - | 26 |
| 14 | මව්බස සිංහල/ මව්බස දෙමළ | 41 | 11 | - | 52 |
| 15 | බුද්ධ ධර්මය | 17 | - | - | 17 |
| 16 | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | 15 | 1 | 7 | 23 |
| 17 | නර්තනය | 21 | - | - | 21 |
| | | 1225 | 162 | 21 | 1408 |

**උපලේඛණය - 02 (අධ්‍යාපන සුදුසුකම්)**

| සිංහල මාධ්‍යය හා දෙමළ මාධ්‍යය | | |
|---|---|---|
| ශ්‍රේණි පරාසය | විෂය | බඳවා ගැනීමේ දී සපුරාලිය යුතු අධ්‍යාපන සුදුසුකම් |
| 1-5 ප්‍රාථමික | ප්‍රාථමික | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සිංහල /දෙමළ භාෂාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා විශේෂ /සාමාන්‍ය උපාධියක් ලබා ඇති කලා උපාධිධාරියකු වීම<br>හෝ<br>කලා විෂය ධාරාව යටතේ සාමාන්‍ය/ විශේෂ උපාධියක් සමඟ උසස් පෙළ විභාගයේ දී සිංහල/දෙමළ විෂය හදාරා තිබීම<br>සහ<br>අ.පො.ස (සා.පෙළ) ගණිතය හා සිංහල/දෙමළ භාෂාව සමත්ව තිබීම. |
| 6-11 ශ්‍රේණි | ඉංග්‍රීසි | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විශේෂවේදී උපාධියක්<br>හෝ<br>ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා සාමාන්‍යවේදී උපාධියක් ලබා තිබීම<br>හෝ<br>පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඕනෑම උපාධියක් සමඟ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) මඟින් පිරිනමන ලද ජාතික උසස් තාක්ෂණ ඩිප්ලෝමාව (ඉංග්‍රීසි) දෙවසරක පූර්ණ කාලීන පාඨමාලාව සහ හය මසක පාසල් පාදක ගුරු පුහුණුව සම්පූර්ණ කර තිබීම<br>සහ<br>අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම. |
| | ගණිතය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක්/ආයතනයක් මඟින් පිරිනමන විද්‍යාවේදී (භෞතීය විද්‍යාව) උපාධියක් ලබා තිබීම.<br>හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක්/ආයතනයක් මඟින් පිරිනමන විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.<br>සහ<br>අ.පො.ස.(උ/පෙළ) සඳහා සංයුක්ත ගණිතය විෂයයක් ලෙස හදාරා ඉන් සමත් වී තිබීම. |

tamilguru.lk

| | | |
|---|---|---|
| 6-11 ශ්‍රේණි | විද්‍යාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක්/ආයතනයක් මඟින් පිරිනමන විද්‍යාවේදී/ව්‍යවහාරික විද්‍යාවේදී/ විද්‍යාවේදී (කෘෂිකර්ම) ප්‍රථම උපාධිය ලබා තිබීම. සහ අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී පහත විෂයයන් 03 එක්වරකදී සමත් වී තිබිය යුතුය.<br><br>1.භෞතික විද්‍යාව<br>2.රසායන විද්‍යාව<br>3. ජීව විද්‍යාව |
| | භූගෝල විද්‍යාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක භූගෝල විද්‍යාව පිළිබඳව විශේෂ උපාධියක්<br>හෝ<br>භූගෝල විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | සංගීතය (පෙරදිග) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක් මඟින් පිරිනමන ප්‍රාසාංගික කලා උපාධි (සංගීතය) ලබා තිබීම,<br>හෝ<br>ප්‍රාසාංගික කලාව/ලලිත කලාව (සාමාන්‍ය) උපාධියක් ලබා, සංගීතය විෂය උපාධියෙහි එක් ප්‍රධාන විෂයක් ලෙස සමත්ව තිබිය යුතු අතර එම උපාධි පාඨමාලාවේ විෂය ඒකක සංඛ්‍යාවෙන් 1/3 ක් සංගීතය විෂයට අදාළව සම්පූර්ණ කර තිබිය යුතුය.<br><br>සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රායෝගික දැනුම හා විෂය ඉගැන්වීම පිළිබඳ දැනුම පරීක්ෂා කරනු ලැබේ. |
| | චිත්‍ර | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක් මඟින් පිරිනමන ප්‍රාසාංගික කලා (චිත්‍ර) උපාධියක් ලබා තිබීම<br>හෝ<br><br>ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා, චිත්‍ර විෂය උපාධියෙහි එක් ප්‍රධාන විෂයයක් ලෙස සමත්ව තිබිය යුතු අතර එම උපාධි පාඨමාලාවේ විෂය ඒකක සංඛ්‍යාවෙන් 1/3 ක් චිත්‍ර විෂයට අදාළව සම්පූර්ණ කර තිබිය යුතුය.<br><br>සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රායෝගික දැනුම හා විෂය ඉගැන්වීම පිළිබඳ දැනුම පරීක්ෂා කරනු ලැබේ. |
| | ඉතිහාසය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක ඉතිහාසය/පුරාවිද්‍යාව පිළිබඳව විශේෂ උපාධියක්<br>හෝ<br>ඉතිහාසය/පුරාවිද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | පුරවැසි අධ්‍යාපනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සමාජ විද්‍යාව/දේශපාලන විද්‍යාව/භූගෝල විද්‍යාව පිළිබඳව විශේෂ උපාධියක්<br>හෝ<br>සමාජ විද්‍යාව/දේශපාලන විද්‍යාව/භූගෝල විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |

| | | |
|---|---|---|
| | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක තොරතුරු තාක්ෂණය හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා විශේෂවේදී හෝ සාමාන්‍යවේදී උපාධියක් ලබා තිබීම. |
| | දෙවන භාෂාවක් ලෙස (දෙමළ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක දෙමළ භාෂාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය හෝ විශේෂවේදී උපාධියක් ලබා තිබීම. |
| | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය<br><br>ව්‍යවසායකත්ව අධ්‍යයනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක ව්‍යාපාර අධ්‍යයනය/ව්‍යාපාර පරිපාලනය/කළමනාකරණය/ ගිණුම්කරණය/ප්‍රධාන විෂයක් ලෙස හදාරා විද්‍යාවේදී හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | මව්බස (සිංහල) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සිංහල භාෂාව පිළිබඳව විශේෂවේදී උපාධියක් ලබා තිබීම හෝ සිංහල භාෂාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | මව්බස (දෙමළ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක දෙමළ භාෂාව පිළිබඳව විශේෂවේදී උපාධියක් හෝ දෙමළ භාෂාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | බුද්ධ ධර්මය | පිළිගත් විශ්විද්‍යාලයක බුද්ධ ධර්මය/බෞද්ධ ශිෂ්ටාචාරය ප්‍රධාන විෂයක් ලෙස හදාරා විශේෂවේදී හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| 6-11 ශ්‍රේණි | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | පිළිගත් විශ්වවිද්‍යාලයක සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය පිළිබඳව විශේෂවේදී උපාධියක් හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම/ ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධියක් තිබීම .<br>හෝ<br>පිළිගත් විශ්වවිද්‍යාලයක ඕනෑම උපාධියක් සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ඊට සමාන පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් එක් වසරකට නොඅඩු සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය පිළිබඳව ඩිප්ලෝමාවක් ලබා තිබීම |
| | නර්තනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මඟින් පිරිනැමෙන ප්‍රසාංගික කලා උපාධි (නැටුම්) ලබා තිබීම.<br>හෝ<br>ප්‍රාසාංගික කලාව/ලලිත කලාව (සාමාන්‍ය) උපාධියක් ලබා, නැටුම් විෂය උපාධියේ එක් ප්‍රධාන විෂයක් ලෙස සමත්ව තිබිය යුතු අතර එම උපාධි පාඨමාලාවේ විෂය ඒකක සංඛ්‍යාවෙන් 1/3 ක් නැටුම් විෂයට අදාළව සම්පූර්ණ කර තිබිය යුතුය.<br>සම්මුඛ පරීක්ෂණයේදි ප්‍රායෝගික දැනුම හා විෂය ඉගැන්වීම් පිළිබඳ දැනුම පරීක්ෂා කරනු ලැබේ. |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

**උතුරු මැද පළාතේ පළාත් සභා පාසල් වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයට 3 පන්තියේ 1 (අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීම -2023**

| ඉල්ලුම් කරන විෂයය අංකය | ඉල්ලුම් කරන විෂය | ප්‍රමුඛතාව |
|---|---|---|
| | | |
| | | |
| | | |

**(පුරප්පාඩු ලේඛණය අනුව සම්පූර්ණ කරන්න. ඉහළම ප්‍රමුඛතාවය අංක 01 ලෙස හා ඊට අනුව ඊළඟ ප්‍රමුඛතා අංක ඇතුළත් කරන්න)**

පුරප්පාඩු සඳහා ඉල්ලුම් කරන විෂයයට අදාළ භාෂා මාධ්‍යය ( සිංහල/දෙමළ/ඉංග්‍රිසි) - ................................

විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පමණක් පැවැත්වෙන බැවින් විභාගය සඳහා පෙනී සිටින භාෂා මාධ්‍ය-

සිංහල ☐ දෙමළ ☐

ස්ථිර පදිංචි පළාත - .................................. දිස්ත්‍රික්කය - ..................................

විභාග මධ්‍යස්ථානයට අදාළ නගර අංකය ☐

1. 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම ( ඉංග්‍රීසි කැපිටල් අකුරින් උදා - PERERA A.B )
..........................................................................................................................................
..........................................................................................................................................

1.2 මුලකුරුවලින් හැදින්වෙන නම් ( ඉංග්‍රීසි කැපිටල් අකුරින් )
..........................................................................................................................................

1.3 සම්පූර්ණ නම ( සිංහලෙන් / දෙමළෙන් ) ..........................................................................................
..........................................................................................................................................

2. වර්තමාන ලිපිනය ( ඉංග්‍රීසි කැපිටල් අකුරින් )
..........................................................................................................................................
..........................................................................................................................................

2.1 ස්ථිර පදිංචි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය ..........................................................................

2.2 ග්‍රාම නිළධාරි කොට්ඨාසය ..............................................................................................

3. 3.1 ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐☐☐

3.2 උපන් දිනය වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.3 ................. දිනට වයස අවුරුදු ☐☐ ☐☐ ☐☐

3.4 ස්ත්‍රී/පුරුෂ භාවය ..........................

3.5 විවාහක / අවිවාහක බව ....................................

3.6 දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

4. හදාරා ඇති උපාධිය පිළිබඳ විස්තර :

4.1 උපාධි පාඨමාලාවේ නම ..............................................................................

4.2 භාෂා මාධ්‍යය ..............................................................................

4.3 විශ්ව විද්‍යාලයේ හෝ අදාළ ආයතනයේ නම ...............................................................................

4.4 උපාධිය වලංගු දිනය .........................................................................................

4.5 උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂය/විෂයයන් (ඉංග්‍රීසි අකුරින්)
(උපාධි සහතිකයේ සහ විස්තරාත්මක ප්‍රතිඵල ලේඛනයේ සහතික කල පිටපතක් ඇමිණිය යුතුය)
....................................................................................................................................

5. 5.1 අ.පො.ස. ( උ.පෙළ ) විභාගය (ප්‍රතිඵල ලේඛනවල තමා විසින්ම සහතික කළ ඡායා පිටපතක් අමුණා ඉදිරිපත් කළ යුතුය. එම ලේඛන එවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

5.2 විභාග අංකය හා වර්ෂය ...........................................................................

| විෂයයන් | ලබාඇති සාමාර්ථය |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |

6. අ.පො.ස. ( සා.පෙ) විභාගය (ප්‍රතිඵල ලේඛනවල තමා විසින්ම සහතික කළ ඡායා පිටපතක් අමුණා ඉදිරිපත් කළ යුතුය. එම ලේඛන එවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

6.1 පළමු වර :

විභාග වර්ෂය ......................................... විභාග අංකය................................

| | විෂයයන් | ලබා ඇති සමාර්ථය | අනු අංකය | විෂයයන් | ලබා ඇති සමාර්ථය |
|---|---|---|---|---|---|
| 01. | | | 06. | | |
| 02. | | | 07. | | |
| 03. | | | 08. | | |
| 04. | | | 09. | | |
| 05. | | | 10. | | |

( වෛකල්පිත විෂයයන් ඇතුළත් නොකළ යුතුය)

6.2 දෙවන වර :

| අනු අංකය | විෂයයන් | ලබා ඇති සමාර්ථය | අනු අංකය | විෂයයන් | ලබා ඇති සමාර්ථය |
|---|---|---|---|---|---|
| 01. | | | 06. | | |
| 02. | | | 07. | | |
| 03. | | | 08. | | |
| 04. | | | 09. | | |
| 05. | | | 10. | | |

7.අයදුම්කරුගේ සහතිකය

7.1 මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සහ/ හෝ අසත්‍ය ලෙස සම්පූර්ණ කර තිබීමෙන් අපේක්ෂකත්වය අවලංගු වන බව පිළිගනිමි.

7.2 මෙම තනතුරට තෝරාගනු ලැබීමෙන් පසුව හෝ නුසුදුසු බව අනාවරණය වූවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව දනිමි

7.3 මෙම නිවේදනයේ සඳහන් කොන්දේසි පිළිපැදීමට මම එකඟ වෙමි.

7.4 පළාත තුළ ඕනෑම පාසලක් සඳහා පත්වීම ලබා ගැනීමට එකඟ වෙමි./නොවෙමි.

දිනය ......................................... ..................................................

අයදුම්කරුගේ අත්සන

8. මුදල් ගෙවූ කුවිතාන්සිය මෙහි අලවන්න.

8.1.මුදල් ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- ............................................................

8.2.ගෙවූ දිනය:.................................................

8.3.කුවිතාන්සි අංකය ....................................................

| විභාග ගාස්තුව ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න |
|---|

9. අත්සන සහතික කිරීම.

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ................................................................................................
...................................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්....................
දින මා ඉදිරියේදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව සහතික කරමි.

.......................................

අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

දිනය - ..............................

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම - ..........................................................................................

තනතුර - ..........................................................................

ලිපිනය - .........................................................................................................................

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

10. අයදුම්කරු මධ්‍යම රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවකයෙකු නම් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය.

මෙම ඉල්ලුම්කරු වන .......................................................................... මයා/මිය/මෙනවිය දැනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ...................................................................... වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් සේවකයෙකු/සේවිකාවක ලෙස සේවය කරන බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කල හැකි/නොහැකි බවත් දන්වමි.

.....................................

ආයතන ප්‍රධානියාගේ අත්සන (නිල මුද්‍රාව)

නම - ..........................................................................................

තනතුර - ..........................................................................................

ලිපිනය - ..........................................................................................

දිනය - ..........................................................................................